## 53

# ගුණාත්මක ව නිර්මාණය විය යුතු යොවුන් සාහිත්‍යය

*මහාචාර්ය බන්දුසේන ගුණසේකර*

යොවුන් සාහිත්‍යය පිළිබඳ අපේ ලේඛකයන්ගේ උනන්දුව පිරිහෙමින් පවතී. නිර්මාණාත්මක සාහිත්‍ය කෘති සහ පරිවර්තන සංඛ්‍යාවක් යෞවනයන් වෙනුවෙන් ලියැවී ඇතත් බහුල භාවිතයට පත් වූයේ එයින් කිහිපයක් පමණකි. සමහර තරුණ තරුණියන්ට තමන් වෙනුවෙන් සාහිත්‍යයක් බිහි වී ඇතැයි යන හැඟීමක්වත් නැත. ඔවුහු බොළඳ කියවීමට හා නැරඹීමට පුරුදුව සිටිති. එහෙයින් ම අපචාරී පැවැත්මට යොමු වී විනාශයට ළං වන්නවුන්ගේ ගණන නොමඳය.

මේ පරිහානිය වළක්වා ගත යුතු ය. උසස් ඉලක්ක ඇතිව, විශිෂ්ට ආකල්ප ඇතිව තරුණ පිරිස් යහපත් චරිතයෙන් හා මනා පෞරුෂයෙන් යුතු පුරවැසියන් කිරීම යොවුන් සාහිත්‍යයෙහි පරමාර්ථ විය යුතු ය.

යොවුන් සාහිත්‍ය සංකල්පය අලුත් වුව ද විසිවන සියවසේ මුල් භාගයේ සිට ම, යෞවනයන් සඳහා පොතපත, ලිපි ලේඛන, විවිධ රචනා හා පාඨ ග්‍රන්ථ ලියූ ලේඛකයන් ගැන අපට සඳහන් කළ හැකි ය. කවිය යෞවනයන් වෙනුවෙන් යොදවා, ඔවුන්ගේ රසඥතාව වර්ධනය කිරීමට ඔවුන් නිර්මාණකරණයට යොමු කිරීමට වෑයම් කළ ආනන්ද රාජකරුණා, ජී.එච්. පෙරේරා, ටිබැට් ජාතික මහින්ද හිමි, කුමාරතුංග මුනිදස මෙහි දී ප්‍රමුඛ ව සඳහන් කළ යුතු ය. චන්ද්‍රරත්න මානවසිංහ, උඳුගොඩ නවරත්න, සුගුණපාල සමරසේකර ආදීහු මේ අතින් මහඟු සේවයක් ඉටු කළහ.

මාර්ටින් වික්‍රමසිංහ, ජී.බී. සේනානායක යොවුන් සාහිත්‍යයට ආදර්ශ කෘති කිහිපයක් එකතු කළහ. ජී.බී. සේනානායකගේ ටිල් දූපතේ අබිරහස, පාළු ළිඳේ අබිරහස, හොල්මන් මැඳුරේ අබිරහස, සතුරු කඳවුර වැනි පරිවර්තන බෙහෙවින් ප්‍රියමනාප ව තිබිණි. රූබන් පීරිස්, ප්‍රැන්සිස් ප්‍රනාන්දු, වී.ඩී. ද ලැනරෝල්, රී. විජයරත්න ආදි ලේඛකයන් පාඨ ග්‍රන්ථ හා අතිරේක කියවීම් පොත් ඉදිරිපත් කිරීමෙන් දරුවන්ගේ කියවීමේ රුචිය දියුණු කළ අතර විවිධ විෂය දැනුම පුළුල් කිරීමට ද මං පෑ බව සඳහන් කළ යුතු ය. කුමාරතුංග මුනිදස ගද්‍ය පද්‍ය රචනා වෙතින් පෑ පෙළහර අද ද මතු ව පවතී.



ළමා සහ යොවුන් සාහිත්‍යය ගැන අවධානය යොමු කරන කාහට වුව ද කුමාරතුංග මුනිදස සූරීන්ගේ **කියවන නුවණ, ශික්ෂා මාර්ගය** වැනි පාඩම් පොත් සිහියට නැඟෙනු නියත ය. ඒ ඒ ශ්‍රේණිවලට ළමයින්ගේ දැනුම් මට්ටම හා භාෂා මට්ටම සලකා, ඒ අතින් ඔවුන් ඉහළට නැංවිය යුතු ඉසව්ව ද සලකා ඔවුන්ගෙන් ලියැවුණු පොත් ක්‍රමානුකූල විය. බොහෝ රචනා නිර්මාණාත්මක ද විය. ඉහළ පන්ති පොත්වලත්, **ප්‍රබන්ධ සංග්‍රහයේත්** එන රචනා ආදර්ශවත් ය. **හත්පණ, හීන්සැරය, මඟුල් කෑම** පොත් තුන හා සමකොට ගත හැකි කෘතීන් කෙරෙහි අපේ ලේඛක වෑයමක් නොදැක්ක හැකි ය.

පශ්චාත් ප්‍රාථමික ශිෂ්‍යයන් සඳහා ලියැවුණු ලෙස සැලැකෙන **ප්‍රබන්ධ සංග්‍රහයෙහි** එන රචනා කුමාරතුංග සූරීහු වස්තු විෂය අනුව කොටස් හයකට වෙන් කරති.

වෘත්තාන්ත තථ්‍ය වස්තු
ඉතිහාස තථ්‍ය වස්තු
චරිත තථ්‍ය වස්තු
වර්ණ්‍ය වස්තු
විචාර්ය වස්තු
කල්ප්‍ය වස්තු

ළමා හා යොවුන් සාහිත්‍ය නිර්මාණයෙහි යෙදෙන්නවුන්ගේ අවධානයට නිසි මේ පෙළගැස්ම එම ලේඛනයෙහි පරමාර්ථ තේරුම් ගැනීමට ද වැදගති.

මෙහි දී අවධාරණය කළ යුතු සම්භාව්‍ය ලේඛකයන් කිහිප දෙනෙකු ඇතත් ඒ සඳහා ඉඩකඩ ගැනීමට නොහැකි ය. විසිවන සියවසෙහි මුල් භාගයේ දී ලියැවුණු එම ලේඛකයන්ගේ පොතපත විමසන විට යොවුන් සාහිත්‍ය මූලධර්ම හා පරමාර්ථ කෙරෙහි ඔවුන් නතුව ගිය සැටි විමසිය හැකි ය. එහෙත් එබඳු උසස් ආකල්ප වර්තමාන ලේඛකයන් වෙතින් නො පෙනේ.

**කථාසරිත් සාගරය** ඇසුරෙන් 1933 දී වැලිවිටියේ සෝරත නාහිමිපාණන් ලියූ **කථාමෘතය, කථා තරංගනිය**, රසවත් හා බුද්ධිමත් කියවීමට යෞවන සිත් යොමු කිරීමක් ලෙස අගය කළ හැකි ය. ටී.බී. ඉලංගරත්න **අඹ යාළුවෝ, ශිෂ්‍යත්වය** වැනි පොත්වලින් යෞවන පෞරුෂය හා ආකල්ප වර්ධනයට වෑයම් කළේ ය. යොවුන් සාහිත්‍ය සංකල්පයත් සමඟ ඉදිරියට ආ ලේඛකයන් අතර මිණිවන් පී. තිලකරත්න, කුලසේන පොන්සේකා, දෙනගම සිරිවර්ධන, අනුලා ද

සිල්වා, සෝමවීර සේනානායක, පියදස වැලිකන්නගේ, ලාල් ප්‍රේමනාත් ද මැල්, ජයරත්න සමරසේකර, අනුලා විජයරත්න මැණිකේ, පියසීලි විජේනායක, සිබිල් වෙත්තසිංහ ආදීහු යොවුන් සාහිත්‍ය පෝෂණයට සාර්ථක වෑයමක යෙදුණෝ වෙති.

"යොවුන් සාහිත්‍යය" යන්න නිර්වචනය කිරීමේ දී "ළමා සාහිත්‍යය" විග්‍රහ කැරෙන ලෙස ම අර්ථ කථනය කළ හැකි වුවත්, ඊට වැඩි ගැඹුරු අර්ථයක් අපේ සිත් සතන් තුළට නැඟෙන බව ඔබට ද හැඟෙනු ඇත. යොවුන් යන වචනයෙහි ජීවිත සෞන්දර්යය වහනය වන ධ්වනියක් - ව්‍යංග්‍යයක් ගැබ් වී තිබේ. එම ප්‍රසන්නතාව හා ගාම්භීර්යය යොවුනන් වෙනුවෙන් ලියවෙන සාහිත්‍යයෙහි ද විය යුතු ය. 'ළමා' යන වචනයෙන් අප තුළ ඇතිවන වාත්සල්‍යය, හුරතලය, දඟකාර ක්‍රියාකාරකම් පිළිබඳ හැඟීම් එම සාහිත්‍යයෙහි ස්වරූපය කියාපායි. එහෙත් 'යොවුන්' යන්නෙහි ගැබ් වී ඇති තැන්පත්බව, කලබලකාරී පැවැත්ම, ගැටලු පිරුණු සංකීර්ණත්වය ඉහත කී සුන්දරත්වය සමඟ එක්වෙයි. ළමා තත්ත්වයෙන් මිදී වැඩිහිටි වියට පා තැබීමට සූදානම් වන මේ වයස් සීමාව එහි පැවැත්මත් සමඟ හඳුනාගැනීම යොවුන් සාහිත්‍ය ලේඛකයාට අනිවාර්ය වෙයි.

ගැටවර විය හෙවත් නව යෞවනය ළමාවිය ඉක්ම වූවකි. ළමාවිය ඉක්ම වූවත් ඔහු වැඩිහිටියෙක් නොවේ. ළමයකු ද නොවන, වැඩිහිටියකු ද නොවන මේ පරිවර්තන අවධියෙහි වෙසෙන ගැටවරයා ගැන බෙහෙවින් සැලැකිලිමත් විය යුතු ය. එසේ නොවුවහොත් ඔහු සුදුසු ඉලක්කයකට ගෙන යෑම දුෂ්කර වනු ඇත.

මේ වයස් සීමාව නිශ්චිත ව සඳහන් නොකළ හැකි වුවත් මනෝවිද්‍යාඥයන්ගේ හා අධ්‍යාපන විද්‍යාඥයන්ගේ තීරණයන් තුලනාත්මක ව සලකා පහත සඳහන් නිගමනයට එළඹිය හැකි ය.

| | | | | |
|---|---|---|---|---|
| අවුරුදු | 3 | - | 6 | ළදරු විය |
| අවුරුදු | 7 | - | 11 | ළමා විය |
| අවුරුදු | 12 | - | 17 | නව යොවුන් (ගැටවර) විය |
| අවුරුදු | 18 | - | 22 | යොවුන් විය |

අප මෙහි දී සඳහන් කරන යොවුන් විය මෙහි තුන්වන හා සිව්වන ගණවලට ඇතුළත් වෙයි. මෙයින් තුන්වන ගණය හෙවත් ගැටවර විය දරුවකු තම පරපුරේ හැඩයට හා ගතියට පිවිසෙන අවධිය ලෙස කෙනෙකුගෙන් හැඳින්වේ. මේ සංක්‍රමණික අවධියෙහි කායික මානසික වර්ධනය ද වේගවත් ය. බුද්ධියෙහි මුහුකුරා යෑම ද වන හෙයින් ඔහු තුළ



හටගන්නා ගැටලුවලට සංවේදී ව ප්‍රතිචාර දැක්වීම ගුරුදෙගුරු, වැඩිහිටි කාගේත් යුතුකම ය. දරුවා උසස් පුරවැසි ඉලක්කයකට පිවිසවිය හැක්කේ එසේ සැලැකිලිමත් වෙමින් ඔහුගේ දැනීම්, දක්ෂකම්, ආකල්ප විශිෂ්ටත්වයට පත් කිරීමෙනි.

චරිත සංවර්ධනයට සරිලන ආකල්ප කෙරෙහි යෞවනයන් ළං කිරීමේ අවශ්‍යතාව අද කැපී පෙනෙන්නකි. විරුද්ධ ලිංගික ආකර්ෂණය මතු වී පෙනුණ ද, අපරදිග සාහිත්‍යයේ මෙන් ගැටවර ආදරය පිළිබඳ කෘතීන් අපේ පැවැත්මට නොගැළපෙයි. අපේ සංස්කෘතික හරයන් සමඟ ගැළැපෙන ලෙස ආදර සබඳතා අන්තර්ගත සාහිත්‍ය නිර්මාණ ඉදිරිපත් කිරීමට හැකි විය යුතු ය. මෙය පරිස්සමින් කළ යුත්තකි.

අද තරුණයන්ගේ පැවැත්ම සංකීර්ණ ය. ඔවුන්ගේ පරිසරය විෂම ය. අපේක්ෂා ආකුල ය. ඇතැම් විට සන්සුන්බවක් පෙන්වන ඔවුන් තවත් විටෙක නොසන්සුන් ය. චිත්ත වෛකල්‍යය, අඳුරු සිතුවිලි, ඇතැම් තරුණ කොටස් වෙතින් මතුව පෙනේ. ප්‍රබුද්ධතාව පොදු ලක්ෂණයක් වුව ද දිගට නො රැඳෙයි. පරිසරයේ විෂමත්වය ඔවුන් කෙරෙහි තදින් බලපායි.

අපේක්ෂා මූලික බව හෙවත් බලාපොරොත්තු සහගත බව යෞවනයාගේ ප්‍රකෘති ලක්ෂණයකි. මේ පියවි ගතිය මෙලවිය යුත්තක් මිස මැලවිය යුත්තක් නොවේ. බොහෝ සහජ ගති හා සහජ ආශාවන් විශිෂ්ටත්වයට පත් කළ හැක්කේ ඒ තුළිනි. ජයග්‍රහණය ළඟාවන්නක් නොව ළඟා කරගත යුත්තකි. ඒ සඳහා උපායශීලී විය යුතු ය. ප්‍රඥවන්ත විය යුතු ය. බුද්ධිමත් තීරණවලට එළඹිය යුතු ය. මේ සඳහා යොවුන් සාහිත්‍යයෙන් කළ හැකි මෙහෙය සියුම් ලෙස අවබෝධ කරගත යුතු ය.

ජනකතාවකින් ගත් ටිකිරිගේ චරිතය මා විසින් නිරූපණය කොට ඇත්තේ ඉහත සඳහන් පරමාර්ථ ඇතිව ය. ඔහුගේ සියලු විටියල හැඟීම් උසස් අතට සංවිධානය කරමින්, විශිෂ්ට ඉලක්කයක් කරා යොමු කිරීමට ආත්තම්මාගේ අත්දැකීම් සහිත අවවාද අනුශාසනා හා මෙහෙයවීම් සමත් වෙයි. ධෛර්යය, අප්‍රතිහත බව, ජයග්‍රාහී අපේක්ෂා, සැලැසුම්ගත කාර්ය සාධන, බුද්ධිමත් විසඳුම්, නිර්භය ක්‍රියාමාර්ග, සහජ දක්ෂතා හා ආකල්ප ගැටවර චරිතයක විශිෂ්ටත්වයට හේතුවන බව ටිකිරිගේ චරිතයෙන් ප්‍රකාශයට පත් වෙයි. ටිකිරිගේ චරිතය සාර්ථක කරගනු සඳහාත්, දුක් කරදර මැඩගෙන අපේක්ෂිත ඉලක්කයට ගමන් කරනු සඳහාත් ඔහුගේ කුසලතා හේතුසාධක වන සැටි විමසීම වැදගති.

යොවුන් සාහිත්‍යය පිළිබඳ ලේඛක උනන්දුව පිරිහීමෙහි හේතු කිහිපයක් වෙයි. පශ්චාත් ප්‍රාථමික ශ්‍රේණිවල සිට අතිරේක කියවීමට දරුවන් යෙදවීම අද දක්නට නැති තරම් ය. දරුවා තරඟකාරී

අධ්‍යාපනයකට යොමු කිරීමේ හානිය අපේ ගුරු දෙගුරුනට තව ම අවබෝධ වී නැත. මානසික සෞඛ්‍යයෙන් යුක්ත ව නිදහසේ බාහිර කියවීම්වලින් යුතු ව ඉදිරියට යන ගැටවරයාගේ ප්‍රබුද්ධතාව, සාමාජික, සංස්කෘතික හා දේශපාලන ගැටලුවලට ඔවුන් මුහුණ දෙන බුද්ධිමත් ආකාරය ඇතැමුන්ගේ භයට හේතුවන බව පෙනෙන්නට තිබේ. භාෂාව සාහිත්‍යය වැනි විෂයන් කෙරෙහි අද රජය දක්වන විරුද්ධ ආකල්පය මෙයට නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.

යෞවනයන් සිංහල පොතපතින් ඈත් කිරීමේ වෑයමක් ද පෙනෙන්නට තිබේ. තමන්ගේ කෘති කෙරෙහි පාඨක අවධානය යොමු නොවන විට ලේඛකයාගේ උදාසීනත්වය අසාධාරණ නොවේ. දරුවන් බොළඳ කියවීමට හා නැරඹීම්වලට යොමු කරන බලවේග හඳුනාගැනීමේ වෑයමක් ද නොපෙනේ. යොවුන් සාහිත්‍යය නිර්මාණයෙහි යෙදෙන උසස් ගණයේ ලේඛකයන් කිහිපදෙනා විසින් හෝ තමන්ගේ නිර්මාණ තමන් ඉලක්ක කොටගත් පාඨක පිරිස අතරට පිවිස තිබේ දැයි විමසන බවක් ද පෙනෙන්නට නැත.

පාඨක රුචිය විමසන යම් යම් පරීක්ෂණ, ප්‍රශ්න කරන සහ ව්‍යාපෘති ගැන වරින්වර අසන්නට ලැබෙතත් ඒවායින් කැරෙන අනාවරණ හෝ නිගමන පිළිබඳ පුළුල් ප්‍රචාරයක් සිදු වූ අවස්ථා ගැන සිහියට නඟා ගත නොහැකි ය. අධ්‍යාපනික හා සංස්කෘතික අවශ්‍යතා, පාඨක සමාජයේ ආකල්ප, වෙනස් වන රුචිරස ආදී පැවැතුම් පිළිබඳ අවධානය ලේඛකයකුට අවශ්‍ය ය. එසේ නිසි අවධානයෙන් තොර ව ලියැවෙන කෘති එම සාහිත්‍යාංගයේ පිරිහීමට තුඩු දෙයි.

යොවුන් පෙළ කියවීමට පුරුදු කිරීමේ දී ඔවුන්ගේ අදහස් උදහස්, හැඟීම්, රුචි රස හා ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධය ලේඛකයාට අවශ්‍ය ය. එම මනෝචාරයන්ට අනුකූල ව පොතපත සැපයීමට ඔවුනට හැකි විය යුතු ය. දරුවා වයසින් වැඩෙත් ම කයින් ද මනසින් ද වැඩෙයි. දැනුමෙන් ද වැඩෙයි. ඒ සමග ම රුචි අරුචිකම් ද වෙනස් වෙයි. ළමා සහ යොවුන් සාහිත්‍යය නිර්මාණයෙහි යෙදෙන ලේඛකයාගේ ගැළපීම් ඒ හා බැඳී තිබිය යුතු ය.

ඉහතින් සඳහන් කළ පරිදි කායික හා මානසික වේගවත් වර්ධනයක් ඇති ව, මුහුකුරා යන බුද්ධිය ද ඇති ව වයසින් වැඩෙන යෞවනයා ගන්ධබ්බයකු බඳු ව එම සංක්‍රමණික අවස්ථාවෙහි අතීන්ද්‍රිය පුද්ගලයකු බඳු වෙයි. අධි මානසිකත්වයට පත් කෙනෙකු මෙන් ඔහු සිතයි. සෑම දෙයක් ගැන ම ප්‍රශ්න කරයි. තමන් අවතීර්ණ වන සමාජය කෙරෙහි ඔහු සියුම් ව බලයි. සැකමුසු වෙයි. එහෙයින් ඔහුට පිළිපදින්නට වන සාම්ප්‍රදායික සිරිත් විරිත්, සාරධර්ම පවා ඔහුගේ



ප්‍රශ්නකරණයට හසු වෙයි. ගුරු දෙගුරුනට ඇතැම් විට මහත් වධයක් ලෙස හැඟෙන මේ යොවුන් පැවැත්ම දෙස බැලිය යුත්තේ කල්පනාකාරී ව ය. සංවේදී ව ය.

අපේ දරුවන් නව යොවුන් වියට එළඹෙන විට කියවීමට දක්වන රුචිය කැපී පෙනෙන්නකි. ත්‍රාසජනක කථා, රහස් පරීක්ෂක කථා හා වීර චරිත කෙරෙහි ඇල්මක් දක්වන ඔවුහු විවිධ පරිවර්තන කෘති කෙරෙහි ද ඇදී යති. එහෙත් ඉතා ඉක්මණින් මේ රුචිය වෙනස් වෙයි. ඉක්බිති කියවීමෙහි උදාසීනකම් ඇති වන්නට පෙර ඔවුන්ගේ මනෝ වෘත්තීන්ට ගැළපෙන පොතපත කෙරෙහි යොමු කිරීම ගුරුභවතුන්ගේ මහඟු මෙහෙයකි. දරුවන්ගේ ඉහත කී ආකල්ප උත්කෘෂ්ට කිරීමේ කාර්යය යොවුන් සාහිත්‍ය නිර්මාණයෙහි යෙදෙන ලේඛකයන්ගෙන් ඉටු විය යුතු ය.

තම දැනුමට අලුත් යමක් එකතු කරගැනීමට, තමන්ගේ ආත්මීය හැඟීම් තුලනාත්මක අගය කිරීමකට දරුවාට ඇති කැමැත්ත, අත්දැකීම් පුළුල් කරගැනීමට යෞවනයාට ඇති පිපාසාව ලේඛකයා සැලැකිල්ලට ගත යුතු ය. දරුවන්ගේ සහජ ආශා, සහජ දක්ෂතා, ඔවුන් ප්‍රිය කරන අත්දැකීම් සහිත පොතපත කෙරෙහි ඔවුන් යොමු කරවීම නොහොත් එබඳු පොත් සම්පාදනය කිරීම වැදගති. පාඨ ග්‍රන්ථයක් - පාඩම් පොතක් - විෂය ග්‍රන්ථයක් කියවීමට වඩා නිර්මාණ ග්‍රන්ථයක් කියවීමට ළමයකු කැමැති වන්නේ එයින් ලැබෙන සතුට - වින්දනය හෙයිනි. එය තමන්ගේ මනෝවෘත්තීන්ට ගැළැපී ගත් විට ඔහු තව තවත් බාහිර කියවීම්වලට පෙලඹෙයි. එය ඔහුගේ බුද්ධි වර්ධනයට මෙන් ම පෞරුෂ වර්ධනයට ද බලපායි. එහෙත් අපේ දරුවනට එම පරමාර්ථවලට අනුකූළ පොත්පත් ප්‍රමාණවත් සංඛ්‍යාවක් බිහි වී තිබේ ද? යන්නට ලැබෙන පිළිතුර කුමක් ද?

යෞවනයන් සඳහා සාහිත්‍ය කෘති නිර්මාණය කරන ලේඛකයන් වෙත පැවැරෙන වගකීම බැරෑරුම් බව වටහා ගත යුත්තකි. ඔවුනට මුහුණ පාන්නට වන සංකීර්ණ අභියෝගයක් බඳු මෙම වගකීම ගැඹුරින් හඳුනාගැනීම පළමු කොට සිදුවිය යුතු ය. යෞවනයා යනු කවරෙක් ද? ඔහුගේ රුචි අරුචිකම් කෙබඳු ද? ඔහු කෙබඳු ආකල්ප ඇත්තෙක් ද? සහජ ළැදිකම් මත ඔහුගේ ක්‍රියාකාරිත්වය හා හැසිරීම් රටා කවරාකාර ද? ආදි වශයෙන් දරුවාගේ කායික මානසික වර්ධනය පිළිබඳ අවබෝධයෙන් තොර ව ළමා සාහිත්‍යය හෝ යොවුන් සාහිත්‍ය නිර්මාණයට බසින්නා කරන්නේ වරදකි.

වයස අනුව දරුවාගේ දැනීම් වෙනස් වෙයි. දක්ෂකම් වර්ධනය වෙයි. භාෂා ඥානය දියුණු වෙයි. බුද්ධිය මුහුකුරා යයි. පිවිසෙන්නට යෙදෙන සමාජය දෙස සැකමුසු වෙයි. ප්‍රඥාව, පෞරුෂය හා ආකල්ප

අතින් ඔහුගේ සංවර්ධනය ගැන ලේඛකයාගේ අවධානය යොමු විය යුතු ය. දරුවාගේ අත්දැකීම්, හැඟීම් - චිත්තධාරා, ක්‍රියාකාරකම් හා අතුරු ගතිගුණ පිළිබඳ අවබෝධය ඇත්තා වඩාත් සාර්ථක නිර්මාණ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ඇත. කෙසේ වුව ද දරුවන් අතට පත් කළ යුත්තේ ඔවුන්ගේ වයසට, දැනුමට, රුචි රසට, මනෝ වෘත්තීන්ට ගැළපෙන නිර්මාණ බව අමුතුවෙන් කිවයුතු නොවේ.

ළමා සහ යොවුන් සාහිත්‍ය නිර්මාණයෙහි යෙදෙන ලේඛකයන් ළමා මනෝ විද්‍යාව හදළ යුතු ය. අධ්‍යාපනික හා මනෝවිද්‍යාත්මක පොතපත හදරමින් ළමයින් ඇසුරු කරමින් ඒ පිළිබඳ දැනුම වර්ධනය කරගැනීමට විදේශීය ලේඛකයන් දරා ඇති වෑයම ගැන අපට අසන්නට ලැබේ.

ළමයින්ගේ හැසිරීම් රටා අධ්‍යයනය කිරීමේ දී ඔවුන් නොයෙක් අවස්ථාවල දී ක්‍රියා කරන ආකාරය, ගැටලුවලට මුහුණ දෙන ආකාරය, අන්‍යෝන්‍ය සබඳතා පිළිබඳ ආකල්ප වටහාගැනීම වැදගති. ළමයින් සියලු දෙනාගේ ම හැසිරීම්, ක්‍රියාකාරකම්, රුචිරස එක්බඳු නොවේ. එකිනෙකාට අනන්‍ය වූ හැසිරීම් විධි, කල්පනා විධි, පැවැතුම් තිබෙන බව පෙනී යනු ඇත. එහෙත් ලේඛකයාට වැදගත් වනුයේ එම පැවැතුම් රටාවල පොදු ලක්ෂණ හඳුනාගැනීමයි.

චරිතය ඇතුළු සංස්කෘතිය අධ්‍යාපන පරමාර්ථයක් ලෙස ලේඛනගත වූවකි. එයින් අපේ පාරම්පරික දයාද, සාරධර්ම හා පුරුෂාර්ථ මුඛ්‍ය කොට ගැනෙයි. යහපත් චරිතය උසස් පුරවැසිබවේ ලක්ෂණයකි. අප ලබා ගන්නා දැනීම, අප වගා කරගත යුතු පුරුදු, දියුණු කරගත යුතු දක්ෂකම්, අප වර්ධනය කරගත යුතු උසස් ආකල්ප සියල්ල පුද්ගල පෞරුෂය සඳහාත් අනන්‍යතාව සඳහාත් වැදගත් වන බව අවධාරණය කළ යුත්තකි.

යොවුන් මනස ප්‍රබුද්ධ ව තබාගැනීමට යොවුන් සාහිත්‍යකරුවනට හැකි විය යුතු ය. ඔවුන්ගේ බුද්ධිය, ප්‍රඥාව, පෞරුෂය අගය කැරෙන නිර්මාණ කෘති මගින් චරිත ලක්ෂණ නංවා ගත යුතු ය. ළමා ලෝකයට වඩා යෞවනයාගේ ලෝකය වෙනස් ය. කාල්පනික ලෝකයට ඔවුන් කැමැති නැත. සුරංගනා කතා ඔවුනට නො ගැළැපෙයි. රහස් පරීක්ෂක කථා, ත්‍රාසජනක කථා, අද්භූත සිද්ධි ඇතුළත් කථා, වීර චරිත කථා, ආදර කථාවලට ඔවුන්ගේ කැමැත්ත රැඳෙතත් ඒ ටික කලකි. තමන්ගේ ම කතන්දරය අසන්නට ඇත්නම් ඔවුහු කැමැතියහ. එහෙයින් තරුණ චරිත ඇතුළත් කථා ඔවුනට ප්‍රියමනාප වනු ඇත. ඔවුන්ගේ ගැටලු විසඳාගන්නට ලැබේ නම්, ඔවුන්ගේ ළැදිකම්වලට අනුව ගැළපේ නම් එතැනට ඔවුන්ගේ රුචිය ඇදෙයි.



යොවුන් වියට පා තබන දරුවා තුළ රංචු ළැදිකම වැඩෙයි. සාමූහික ව සිටීමේ මෙන් ම නායකත්වය පිළිබඳ රුචිය ද, තරගවලින් ජයගැනීමේ කැමැත්ත ද ලියලයි. අන්‍යයන් ඉදිරියේ කැපීපෙනීමත් වීරයකු නොහොත් සමාජවාදියකු ලෙස, ප්‍රගතිශීලී පුද්ගලයකු ලෙස කටයුතු කිරීමේ අභිලාෂයන් මතු ව පෙනෙයි. ප්‍රසිද්ධිය සොයා යෑම ද ගැටවර රුචියකි. ලිංගික ළැදිකම ද ප්‍රබල ව මතු වෙයි. විරුද්ධ ලිංගිකයන් ඇසුරු කිරීමේ කැමැත්ත, ඔවුන් වෙනුවෙන් පරිත්‍යාගශීලී වීමේ, සහය වීමේ කැමැත්ත ආගන්තුක ව වැඩෙයි. විරුද්ධ ලිංගිකයන් කෙරේ ආකර්ෂණය වීම කෙරෙහි වැඩිහිටි සැලැකිල්ල යොමු වීම මෙකල ඉතා වැදගත් කරුණකි. යොවුන් සාහිත්‍යකරුවනට මෙබඳු පැවැතුම් විශිෂ්ටත්වයට වෙනස් කිරීමේ ශක්තිය වෙයි. දරුවන්ගේ සහජ ළැදිකම් පදනම් කරගන්නා ලේඛකයන් පරිස්සම් විය යුත්තේ, එමඟින් දරුවන්ගේ යහපතට, මානසික පවිත්‍රතාවට, චරිත ශුද්ධියට මං සැලැසිය යුතු හෙයිනි.

යෞවනයන්ගේ මානසික බිඳ වැටීම භයානක ය. උදාසීන පැවැත්ම මෙන් ම දඩබ්බර පැවැත්ම ද පාලනය කරගත යුතු ය. අන්තර්ගතික, බහිර්ගතික චරිත ලක්ෂණ ඇත්තවුන් බිහිවන්නේ දරුවන්ගේ මානසික හා කායික පැවැතුම් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීමේ හේතුවෙනි.

මනෝවිද්‍යාඥයන්ගේ හැඳින්වීම අනුව පුද්ගලයකුගේ ජීවිතයෙහි ඉතාමත් වැදගත් අවධිය ලෙස නවයොවුන් විය සැලැකිල්ලට පාත්‍ර වෙයි. දෙලොවක් අතර දෝලනය වන යෞවනයා වරෙක ළමා ලොවෙහි ද, තවත් වරෙක වැඩිහිටි ලොවෙහි ද කල් ගෙවයි. කායික හා මානසික වශයෙන් උපරිම වර්ධනය සිදුවන හෙයින් මෙම පරිවර්තන යුගය සඳහා ලියැවෙන සාහිත්‍යය ද සංක්‍රාන්තික සාහිත්‍යයක් විය යුතු යැයි කියන මනෝවිද්‍යාඥ, මහාචාර්ය ආර්. පී. ලියනගේ මහතා එම සාහිත්‍යයෙහි විය යුතු ගති ලක්ෂණ හඳුන්වා දෙන්නේ මෙසේ ය.

"තරුණයන් සඳහා ලියන පොතපතින් ඔවුන් යහමඟට යොමු කිරීමටත්, සංවර්ධනකාරී ලෙස වැඩිහිටි භාවයට පත් කිරීමටත් මඟ පෙන්වන සාහිත්‍ය කෘති මේ අවධිය සඳහා නිර්මාණය කළ යුතු ය. මෙයින් අදහස් කරන්නේ යථාර්ථය වසන් කර සර්ව සුභවාදී ලොවක් මවාපෑම නොව යථාර්ථය තුළින් සුභවාදී පැත්තට යොමු වීමට ඇති ඉඩකඩ හා මංපෙත් පාද දීම ය. ශාරීරික වශයෙන් ද මා තුළ ඇති වන ශීඝ්‍ර වර්ධනය හා වෙනස්කම් නිසා මෙම වියට පත් වන ළමයා තුළ ඉතා සංකීර්ණ කැලඹිලි, ගැටුම් හා අසහනකාරී තත්ත්වයන් ඇති විය හැකි ය. මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය පරිණතභාවය හා අත්දැකීම්

ඔහු තව ම ලබා නැත. එම අත්දැකීම් හා පරිණත භාවය කියවන සාහිත්‍යය තුළින් ලබා දීමට අප ලියන පොතපත සමත් විය යුතු ය. යෞවනයන් සඳහා ලියන සාහිත්‍ය කෘතිවල අන්තර්ගතයන් වචන මාලාවෙන්, ශෛලියෙන් මේ මානසික තත්ත්වයනට පත් කිරීමට අප සමත් විය යුතු ය. වැඩිහිටි ආධිපත්‍යයෙන් මිදී ස්වාධීනත්වයක් ලබාගැන්ම සඳහා ආශා කරන යෞවනයා තවදුරටත් ළමයකු ලෙස සැලැකීමට වැඩිහිටි සමාජය පෙලඹෙන අවස්ථා බොහෝ ය. එක් අතකින් වැඩිහිටියන්ගේ මෙම ආකල්පය යෞවනයා, නොරුස්සනු පමණක් නොව තම ජීවිත ක්‍රියාකාරකම්වලින් වැඩිහිටියන් මැදිහත් වීම ද ප්‍රතික්ෂේප කරයි. මේ නිසා මේ පරම්පරා දෙක අතර ඇතිවිය හැකි ගැටුම් තත්ත්වයන්ගෙන් මුදා ගැන්මට යෝග්‍ය වන සාහිත්‍ය කෘති යෞවනයන් සඳහා නිර්මාණය කිරීමට ලේඛකයාට හැකි විය යුතු ය.

තවත් අතකින් යෞවනයා තවදුරටත් වැඩිහිටියන්ගේ විශ්වාසය හා ආධාරය පතයි. ඒ බව වටහාගන්නා සාහිත්‍යකරු වැඩිහිටියන් ද යෞවනයා කෙරේ පූර්ණ විශ්වාසය තබන බවත් හැම විට ම උපකාර කිරීමට සූදනමින් සිටින බවත් පිළිබිඹු කරන සාහිත්‍ය නිර්මාණ කළ යුතු ය. ධෛර්යය ඇති කරවන සාහිත්‍යයක් ම ලිවිය යුතු ය. නව යොවුන් වියට පත් වත් ම ඇති වන ශීඝ්‍ර කායික වර්ධනය නිසා තමා අවට සිටින පුද්ගලයන් අතර කැපීපෙනෙන ආශාවක් ද යෞවනයන් තුළ ඇති වන බව අප අමතක නොකළ යුතු ය. එම ආශාවන් තෘප්තිමත් කරවන පද්‍ය හා ගද්‍ය කෘති තරුණයා අරබයා ලිවිය යුතු ය. අපේ සාහිත්‍ය කෘතිවලින් තරුණයා පිළිගන්නා බව පෙන්වමින් මානසික තෘප්තියක් ලබාදිය යුතු ය. තව ද කායික වශයෙන් සිදු වන වෙනස්කම් ද සමඟ ඇති වන සමාජමය වැදගත්කම ඔවුන් ව්‍යාකූලත්වයට පත් නොකිරීමට ද වගබලා ගත යුතු ය. එවන් ව්‍යාකූල තත්ත්වයන්ගෙන් මුදා ගනිමින් වැඩිහිටි භාවයේ අපේක්ෂා ඉටු කර ගැන්මට පුද්ගලයා සැබැවින් ම පොලඹවන, දිරිගන්වන සාහිත්‍යයක් තරුණයන් සඳහා බිහි කළ යුතු ය.

"නව යොවුන් වියට පත්වන පුද්ගලයා බුද්ධිමය වශයෙන් වැඩි පරිණතභාවයක් ලබාගැනීමේ හැකියා ඇත්තෙකි. මෙම වර්ධනයට ප්‍රබෝධකයක් ලෙස ප්‍රමාණවත් හරවත් තේමාවන්ගෙන් යුතු සාහිත්‍ය කෘති අපෙන් බිහිවිය යුතුය. එසේ ම සමකාලීන සමාජයේ සංස්කෘතික සන්දර්භයෙන් පෝෂණය ලබා වර්ධනය කරගන්නා පෞරුෂයත්, සාරධර්මවලින් වඩාත් ඔප්නංවා ගැනීමට මඟ පෙන්වන සාහිත්‍ය කෘති නිර්මාණය කළ යුතු ය. තෝමස් මාස්ලෝ වැනි මනෝ විද්‍යාඥයන් විසින් දක්වා ඇති මානුෂික අවශ්‍යතා ද යෞවනයන් සඳහා සාහිත්‍ය පොතපත කරන අය දැන ගත යුතුයි. මාස්ලෝ පවසන්නේ යෞවනයා



පිපාසිත කුතූහලයෙන් හා අවශ්‍යතා කඩිනමින් සපුරා ගැනීමේ අපේක්ෂාවන්ගෙන් පිරි අයෙකු බවයි. යොවුන් වියේ සිටින අයගේ සාමාන්‍ය ස්වභාවය ද සාහිත්‍යකරු වටහාගත යුතු ය. තරුණයා තමා ළමා වියේ දී අත්දකින සමබරභාවය යොවුන් වියට පත්වෙත් ම එය කඩා බිඳ වැටෙන ස්වභාවයක්, තමා දෙලොවක් අතර අතරමං වූවකු ලෙස ද දැනෙන තරමට මානසික අවුල් සහගතබවක් ද දැනෙයි. වරින් විට ළමා ලොවින් හා වැඩිහිටි ලොවින් ප්‍රතික්ෂේප වන අවස්ථාත් ලෝක දෙකේ ම භූමිකා දරන්නට සිදුවන අවස්ථාත් දක්නට ලැබේ. යෞවනයන් සඳහා සාහිත්‍ය නිරමාණ කරන අය මේ බව වටහාගෙන යෞවනයා අතරමං නොවන තත්ත්වයකට ගෙන ඒමට පොතපත ලිවිය යුතු ය. නැතහොත් ප්‍රතික්ෂේප නොවන ආකාරයේ හැඟීම් ඇති කරවන සංවර්ධනකාරී චින්තනයට යොමු කරවන ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා නාට්‍ය නිර්මාණය කළ යුතු ය."

යොවුන් සාහිත්‍ය මූලධර්ම හා පරමාර්ථ පිළිබඳ නිර්දේශ තුළින් "රන් ටිකිරියි ගොළු කුමරියි" ලිවීමට මා අදහස් කෙළේ යොවුන් සාහිත්‍යයට ගැළපෙන විෂයධාරා කිහිපයක් දෙසට ලේඛකයන්ගේ අවධානය යොමු කිරීමට ය. ගිරුවාපත්තුවෙන් ලැබුණු ජනකතාවක් කියවූ මට, එම කතාවට ඓතිහාසික පසුතලයක් යෙදීමෙන් කුහුල දනවන ආදර්ශවත් යොවුන් කතාවක් නිර්මාණය කළ හැකි බව හැඟිණි.

ඉක්බිති මට වුවමනා කෙළේ ගොළු රජ දියණියගේ ගොළුකමට හේතුවත්, එය අනාවරණය කරගැනීමට ටිකිරි දක්වන බුද්ධිමත් වෑයමත් දක්ෂතාවත් මතුකොට දැක්වීම ය. රජු විසින් පැහැර ගන්නා ලදු ව මව්පිය සම්පතින් බැහැර ව ළදරු වියේ සිට ආත්තම්මාගේ රැකවරණය මත වැඩෙන ටිකිරිගේ පාරම්පරික දක්ෂතාත්, සහජ කුසලතාත් දුඃඛිත ව සිටිමින් වුව ද ස්වකීය අපේක්ෂා ඉටු කරගැනීමේ ධෛර්යයත්, ආත්ම විශ්වාසයත් ඔහුට වාසනාව ගෙනෙන සැටි උදසීන තරුණ මනසකට හොඳ ආභරණයක් වන බව මගේ හැඟීම ය.

ටිකිරි අසරණ ය. අහිංසක ය. එහෙත් ඔහු ඉදිරියට මෙහෙයවන ආත්තම්මා දිරිමත් මැහැල්ලකි. ජීවිතයේ ලද සියලු දුක් විඳ දරා ගනිමින් ඇය ටිකිරි ජවසම්පන්න බුද්ධිමත් නායකයකුගේ තැනට මෙහෙයවන ආකාරය අපේ වැඩිහිටි පරපුරට ආදර්ශයකි.

කතරගම ක්ෂත්‍රිය රජ දරුවන් දස දෙනාගේ ඝාතනයත් සමඟ විසිර යන ඥාතීන් ස්වකීය බලය පරම්පරාගත ගෞරවයට හා පෞරුෂයට සරිලන සේ ගොඩනඟා ගනිමින් කැලණිය, ගිරි නුවර, සේරු නුවර ආදි තන්හි රාජ්‍ය බලය තහවුරු කරගන්නා ආකාරය ඉඟි කරමින්, "ටිකිරි" නමැති සිඟිත්තා බුද්ධිමත් තරුණයකු වෙමින් සියලු අපේක්ෂා ඉටු කර

ගන්නා සැටි යථාරූපී ව නිරූපණය කරනු සඳහා ඓතිහාසික වෘත්තාන්ත කිහිපයක ආභාසය ලබා ගන්නට මට සිදු විය.

මෙයින් මා අදහස් කළේ යොවුන් සාහිත්‍යය හුදෙක් කල්පිතයට ම සීමා නොකොට, යථාර්ථවාදී ව අපේ ම පැවැත්ම එළිකොට දැක්වීම ය. මායා යථාර්ථය ද මෙහි ලා මිශ්‍ර කොට ගැනුණ ද එහි අද්භූතයක් නොවන බව බුද්ධිමත් පාඨකයට හැඟී යනු ඇත. මෙහි අගට යෙදෙන ඌනපූරණය ටෙලි නාට්‍ය රචකයකුට වඩාත් ගැඹුරු ඓතිහාසික පසුතලයක් යොදගනු පිණිස ය. ආයුධ සන්නද්ධ රජු ඇතුළු සිවුරඟ සේනා සමඟ ආයුධ විරහිත කතරගම රජ දරුවන් ගැමියන් සමඟ කළ ජයග්‍රාහී සටන මෙහි දී අවධාරණය කළ යුත්තකි. ස්වකීය ප්‍රියමනාප වැසියන්ගේ විනාශය නොරිසි දසහතිකයන් යටත් වූයේ සිය කැමැත්තෙනි. නිරායුධ ඔවුන්ගේ ඝාතනය ගෝඨාභය මහරජුට ඓතිහාසික කළු ලපයක් ඇති කළ සිද්ධියකි. මහ වෙහෙර දහසක් නැංවීමෙන් වුව ද ඔහුට එය මකාලිය නොහැකි විය. මහාවංශගත මෙබඳු සිද්ධීන් සැකෙවින් සඳහන් කෙරුණේ ඉතිහාසය තුළින් වර්තමානයට ද එබෙනු පිණිස ය.

අපේ තරුණ කොටස් ප්‍රබුද්ධ ව තබාගැනීම සඳහා ඔවුන්ගේ බුද්ධියට ආමන්ත්‍රණය කළ හැකි නිර්මාණ අපට අවශ්‍ය ය. ජාතියේ පෞරුෂය බිඳ වැටෙන මෙබඳු අවධියක බොළඳ - ඕලාරික රසයට නැමෙන දරුවන් එයින් මුදවාගෙන චරිතවත් බුද්ධිමත් පුරවැසි පිරිසක් තනාගැනීමේ අභිප්‍රාය අපේ යොවුන් සාහිත්‍ය නිර්මාණකරුවනට තිබිය යුතු ය.

# 54

# "Middle Path" and the "Middle Doctrine" In Buddhism

*Professor Kapila Abhayawansa*

## Middle path

It is a well known fact that the Buddha is said to have realized middle path (*Majjhimā pamipadā*) as the way which leads to the cessation of suffering (*Dukkha-nirodha*)[1]. The aim of the noble quest of Siddhārtha Gautama before being the Buddha was to find out the solution to the problem of suffering encountered by all living beings in the world[2]. The Buddha made use of his first sermon, *Dhamma-cakkappavattana-sutta*[3] to reveal what he realized in his enlightenment as the result of his noble quest for the benefit of the world. Out of four Noble Truths which the Buddha realized in his enlightenment the last Noble truth, the way leading to the cessation of suffering (*Dukkhanirodhagāmini pamipadā*) is identified by him with the middle path (*Majjhimā pamipadā*). This middle path is further identified as the Noble eight-fold path (*Ariyo amm,, hangiko maggo*) in the very same sutta[4]. The way leading to the cessation of suffering is said to be middle path as it avoids two extremes namely self indulgence (*Kāma-sukhallikānuyoga*) and self mortification (*Attakilamthānuyoga*)[5]. Self indulgence is considered as a way of life recognized by the materialists in order to achieve sensory gratification. Likewise, self mortification is considered as a religious way of life recognized by the Jaina thinkers in order to purify the soul from previous Karmas done by the people. It should be emphasized here that the way recommended by the Buddha for the cessation of suffering or the realization of liberation (*Nibbāna*) is a mode of life which reduces the crude characteristics of both the extremes. Extreme forms of both luxury life and painful life are avoided in the middle way realized by the Buddha as they do not lead to the cessation of suffering. Hence it is called middle way or middle path.

The term *Pamipadā* used in both *Majjhimā-pamipadā* and *Dukkha-nirodha-gāmini pamipadā* can be justifiably rendered into English as Middle way or middle path for the reason that the Buddha himself used the term *Magga* as a synonym to term *Pamipadā*[6]. Therefore, it imports